# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.05.21 |

## සංචරණ සීමා මත ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි සේවා දුරස්ථව/ප්‍රාදේශීයව ලබා දීම

රට තුළ පවතින සංචරණ සීමාවන් යටතේ කොළඹ ප්‍රධාන කාර්යාලයට හා මහ බැංකුවෙහි ප්‍රාදේශීය කාර්යාලවලට නොගොස් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ඉටු කරගත යුතු සේවා කටයුතු තැපැලෙන්, විද්‍යුත් තැපැලෙන්, අන්තර්ජාලය මගින් හෝ වාණිජ්‍ය බැංකු ශාඛාවක් මගින් කර ගැනීමට දැන් හැකියාව තිබේ.

1. **''සී'' වාර්තා මගින් සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීම**

   දිවයින පුරා පිහිටි මහජන බැංකුවෙහි ඕනෑම ශාඛාවකට පිවිස ''සී'' වාර්තාවෙහි ඇති යොමු අංකය සඳහන් කර සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් සඳහා වන චෙක්පත්/මුදල් තැන්පතු පතක් සම්පූර්ණ කර කවුන්ටරයට ගෙවීම් සිදු කර ''සී'' වාර්තාව කවුන්ටරයට භාර දෙන්න.

   යොමු අංකය සහිත ''සී'' වාර්තාව ඔබ සතුව නැත්නම් යොමු අංකය දැන ගැනීමට පහත දුරකථන අංකයකට අමතන්න.

   **විමසීම් :** 011-2206637, 011-2206638, 011-2206639, 011-2206659, 011-2206661

2. **බැංකු ශාඛාවකින් විද්‍යුත් ක්‍රමයට දායක මුදල් ගෙවීම**

   කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව (NDB බැංකුව) හා ඩී එෆ් සී සී (DFCC) බැංකුවෙහි ඕනෑම ශාඛාවක් මගින් මංගත ක්‍රමයට (Online) හෝ සෘජු හරකිරීම් (Direct Debit) මගින් දායක මුදල් ගෙවීමට හා සාමාජික තොරතුරු එවීමට හැකිය. ඒ සඳහා ලියාපදිංචි වීමට හා වැඩිදුර විස්තර ලබා ගැනීමට පහත දුරකථන අංකයකට අමතන්න.

   **විමසීම් :** 011-2477475, 011-2477927, 011-2477971, 011-2477981, 011-2477987, 011-2477990, 011-2477999

3. **ගිණුම් ශේෂ සහතික සාමාන්‍ය තැපැලෙන් ලබා ගැනීම**

   පිළිතුරු තැපැල් කළ පසු කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම් දීමට ජංගම දුරකථන අංකයක් සඳහන් කළ සාමාජික අත්සන සහිත ඉල්ලීම් ලිපියක් සමග ජාතික හැඳුනුම්පතෙහි හා ''බී'' කාඩ්පතෙහි පිටපත් මෙම දැන්වීමෙහි අවසානයෙහි සඳහන් ලිපිනයට එවන්න.

4. **ගිණුම් ශේෂ සහතික විද්‍යුත් තැපෑලෙන් ලබා ගැනීම**

ඉල්ලීම් ලිපියක් සමඟ ජාතික හැඳුනුම්පතෙහි හා ''බී'' කාඩ්පතෙහි ඡායාස්ථගත පිළිබිඹුපත් epfhelpdesk@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවන්න.

5. **සාමාජික ගිණුමෙහි සඳහන් නම/ජාතික හැඳුනුම්පත් අංකය සංශෝධනය කර ගැනීම**

සක්‍රීය සේවායතනයක සාමාජිකයකුගේ එම තොරතුරු සංශෝධනය සඳහා සේවායතනයේ ලිපි ශීර්ෂය සහිත ඉල්ලීම් ලිපියක් සමඟ සේවායෝජක විසින් සහතික කරන ලද නිවැරදි ජාතික හැඳුනුම්පතෙහි, ''බී'' කාඩ්පතෙහි හා උප්පැන්න සහතිකයෙහි පිටපත් මෙම දැන්වීමෙහි අවසානයෙහි සඳහන් ලිපිනයට එවන්න.

විවාහය නිසා නම වෙනස් වීමකදී, ජාතික හැඳුනුම්පත අලුත් කිරීමක දී හා උප්පැන්න සහතිකයෙහි නම වෙනස් කිරීමක දී අදාළ ලේඛනවල සහතික කළ පිටපත් එවන්න.

6. **විදේශ ගතවීම සඳහා වීසා (VISA) අයදුම් කිරීමට සාමාජික ශේෂ සහතික/දායක මුදල් විස්තර වාර්තා ලබා ගැනීම**

ඉල්ලීම් ලිපියක් සමඟ ජාතික හැඳුනුම්පතෙහි, ''බී'' කාඩ්පතෙහි, වලංගු ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවෙහි හා වීසා අයදුම්පතෙහි ඡායාස්ථගත පිළිබිඹුපත් තම පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයෙන් epfonlinebalance@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවන්න.

**ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට සහ ප්‍රාදේශීය කාර්යාල වලට පැමිණ සේවා ලබා ගැනීම, පවතින වසංගත තත්ත්වය මත අතිශයින්ම සීමා කරන මෙන් ඉල්ලා සිටින අතර, ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් හෝ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ආශ්‍රිත ඕනෑම සේවාවක් ලබා ගැනීම සම්බන්ධව විස්තර දැන ගැනීමට බැංකු වැඩ කරන දිනක පෙ.ව. 7.45 සිට ප.ව. 4.00 දක්වා මහජන සම්බන්ධතා හා විමසීම් අංශයෙහි පහත දුරකථන අංකයකට අමතන්න.**

**දුරකථන අංක** : 011-2206642, 011-2206690, 011-2206691, 011-2206692, 011-2206693, 070-2252051, 070-1278502, 070-2247862

**ෆැක්ස් අංක** : 011-2206694

**විද්‍යුත් තැපැල් ලිපිනය** : epfhelpdesk@cbsl.lk

**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි වෙබ් අඩවිය වන www.epf.lk වෙත පිවිසීමෙන් ඉහත කරුණු පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.**

**අධිකාරී**
**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**12 වන මහල, 5 වන කුලුන**
**අංක 30, ජනාධිපති මාවත**
**කොළඹ 01**